**තංගල්ල නගර සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
-------------------------------

**1 මූල්‍ය ප්‍රකාශන**
-----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
---------------------------------

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජූලි 14 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 23 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට තංගල්ල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
------------------------------------------

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම**
-------------------------------------------------------------------

2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් වරයාගේවක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින්ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**
------------------------
පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් වෙනුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු. 4,378,602 ක් ණයහිමි වෙන් කිරීම් කර තිබුණද , පළාත් රාජ්‍ය සේවා විශ්‍රාම වැටුප් දායක බිල්පත් අනුව , එය රු. 4,432,486 ක් විය. ඒ අනුව රු. 53,884 ක් අඩුවෙන් වෙන්කිරීම් කර තිබුණි.

(ආ) 2011 වසර වෙනුවෙන් ගෙවිය යුතු විගණන ගාස්තු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 10 දින රු. 85,135 ක් ගෙවා ඇති අතර එය නැවතත් ණයහිමියන් ඇතිකර පියවා තිබූ අතර පැරණි ණයහිමි වෙන්කිරීම් රු. 50,000 එලෙසම ගිණුම්වල ඉදිරියට එමින් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පත් පොළී ගණනය කිරීමේදී ගිණුම් කාලපරිච්ඡේදය නොසලකා ගිණුම් තැබීමෙන් රු. 30,186 ක පොළී ආදායම් අඩුවෙන් ගිණුම්ගතවී තිබුණි.

(ඈ) ජර්නල් සටහන් 54 න් ආදායම් හා වියදම් ගිණුම රු. 50,134,585 ක් හරකර ගිණුම් විෂයයන් 4කට රු.49,967,353 ක්ලෙස බැරකර තිබීමෙන් රු. 167,232 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම රු. 3,250,580 ක් වුවද, 2011, 2012 හා 2013 වර්ෂයේ අප්‍රේල් මස දක්වා වූ කාලයට අදාලව සමාලෝචිත වර්ෂය තුල මුදලින් ලද ආදායම සහ 2013 වර්ෂය සඳහා ණයගැති ප්‍රතිපාදන ලෙස වෙන්කළ ප්‍රමාණයෙහි එකතුව වූ රු. 4,752,330 ක් ආදායම් හා වියදම් ගිණුමට බැරකර තිබීමෙන් එම ආදායම් රු.1,501,750 ක් වැඩියෙන් ගිණුම්ගතවී තිබුණි.

(ඊ) ශේෂ පත්‍රයේ විවිධ ණයගැති ශේෂය තුල 2006, 2007 , 2008 , 2009 හා 2011 යන වර්ෂයන් සඳහා එකතුව රු. 2,192,066 ක මුදලක් මුද්දර ගාස්තු ලෙස ලැබිය යුතු බව දක්වා තිබුණද එවැනි මුදලක් මුද්දර ගාස්තු ලෙස ලැබියයුතු බව වාර්තා අනුව නිරීක්ෂණය නොවීය.

(උ) සමාලෝචිත වර්ෂයේ ශේෂ පත්‍රයේ විවිධ ණයගැතියන් යටතේ 2012 වර්ෂය සඳහා දකුණු පළාත් සභාවෙන් රු. 3,700,475 ක මුදලක් ලැබිය යුතු ලෙස දක්වා තිබුණද 2012 වර්ෂයට අදාලව ලැබිය යුතු සියළු මුදල් 2013 වර්ෂය තුලදී ලැබී තිබූ අතරසමාලෝචිත වර්ෂය අවසන් දින වන විට දකුණු පළාත් සභාවෙන් 2013 වර්ෂය සඳහා රු. 1,780,300 ක මුදලක් මුද්දර ගාස්තු ලෙස ලැබිය යුතු වුවත් රු. 363,000 ක් පමණක් විවිධ ණයගැතියන් යටතේ ශේෂ පත්‍රයේ දක්වා තිබීමෙන්විවිධ ණයගැතියන්රු. 1,417,300ක්අඩුවෙන්දක්වාතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය සඳහා වීථි පහන් නඩත්තු කටයුතු වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයෙන් 2013 දෙසැම්බර් 31 දින වන විට රු. 45,636 ක මුදලක් ප්‍රතිපූර්ණය විය යුතු වුවත් එය ශේෂ පත්‍රයේ ණයගැතියන් යටතේ දක්වා නොතිබූ අතර 2012 වර්ෂය සඳහා වීථි පහන් නඩත්තු කටයුතු වෙනුවෙන් රු. 34,227 ක මුදලක් ලැබිය යුතු ලෙස ශේෂ පත්‍රයේ විවිධ ණයගැතියන් යටතේ දක්වා තිබුණද එම මුදල 2013 පෙබරවාරි 26 දින අංක 13078 දරන ලදුපත අනුව ලැබී තිබුණි.

(එ) ශේෂ පත්‍රයේ ණයගැතියන් යටතේ 2005 සිට 2009 දක්වා වූ වර්ෂයන් සඳහා වීථි පහන් නඩත්තු කටයුතු වෙනුවෙන් ලැබිය යුතු ලෙස එකතුව රු. 500,113 ක මුදලක් දක්වා තිබුණද එවැනි මුදලක් ලැබිය යුතු බව ලේඛනය හෝ ලිපිගොනු අනුව නිරීක්ෂණය නොවීය.

(ඒ) 2012 වර්ෂය සඳහා එකතු කළ අගය මත බදු ලෙස රු. 197,357 ක මුදලක් වෙන්කර තිබුණද 2013 වර්ෂයේදී රු. 146,403 ක් පමණක් 2012 වර්ෂයට අදාල එකතු කළ අගය මත බදු ලෙස ප්‍රේෂණය කර තිබුණි. වැඩියෙන් වෙන්කරන ලද රු. 50,954 ක වටිනාකම වෙනුවෙන් ගැලපීම් සිදුකර නොතිබුණි.

**1.3.3 නොසැසඳු පාලන ගිණුම්**

---------------------------

සමාලෝචිත වර්ෂයේ පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබූ ගිණුම් විෂයයන් දෙකකට අදාලවමූල්‍ය ප්‍රකාශනවල ශේෂය හා ඊට අදාල උපලේඛන / උපයෝගී ලේඛන අතර රු. 1,512,501 ක නොසැසදීම් නිරීක්ෂණය විය.

**2. මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 812,559 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,334,044 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු. 000' | රු. 000' |
| i. | වරිපනම් හා බදු | 2,600 | 2,779 | 2,274 |
| ii. | බදුකුලී | 8,674 | 5,796 | 7,225 |
| iii. | බලපත්‍ර ගාස්තු | 542 | 347 | 24 |
| iv. | වෙනත් ආදායම් | 83,798 | 41,503 | 10,694 |

### 2.2.2 වරිපනම් බදු

2013 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු මුදල රු. 2,190,732 ක් වූ අතර නගර සභා ආඥා පනතේ 170 (අ) ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. සභාපතිවරයා විසින් 2014 දෙසැම්බර් 05 දිනැති පිළිතුරු ලිපියෙන් උක්ත හිඟයෙන් රු. 494,083 ක් අයකරගෙන ඇති බව මා වෙත දන්වා තිබුණි.

### 2.2.3 කඩකාමර බදු

i. දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දින අංක දපපා/2010/01 දරන චක්‍රෙල්ඛයේ 02 ඡේදය ප්‍රකාර තක්සේරුකරුවෙකු ගෙන් ලබාගන්නා තක්සේරුව පදනම් කරගෙන සියලුම කඩ කාමර සඳහා කඩ කාමර කුලී මුදල් තීරණය කළයුතු වුවද, සභාව සතු කඩකාමර 54 ක් සඳහා කුලී මුදල් තීරණය කළ ආකාරය විගණනයට ඉදිරිපත් නොවීය. එසේම ගිවිසුමේ සඳහන් මාසික බදු මුදල සහ දැනට අයකරන බදු මුදල අතර වෙනස්කම්ද පැවතුණි.

ii. උක්ත චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාර සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළයුතු වුවද, සභාව සතු කඩකාමර සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි.

iii. උක්ත චක්‍රලේඛයේ 11 ඡේදය අනුව බදුකරු වෙනත් පාර්ශවකරුවකු වෙත බදු අයිතිය පැවරීම සභාවේ අනුමැතියකින් තොරව නොකළ යුතු වුවත් සභාව සතු කඩකාමර බොහෝ ප්‍රමාණයක ව්‍යාපාරික කටයුතු බදුකරු නොවන වෙනත් පාර්ශවකරුවෙකු විසින් සිදුකරන බව ලිපිගොනු අනුව නිරීක්ෂණය විය.

iv. ඉහත චක්‍රලේඛයේ අංක 09 ඡේදය අනුව බදුකරුගේ ඉල්ලීම අනුව හෝ බදුකරු මියගිය අවස්ථාවේදී බදු අයිතිය පවරා දිය හැකි වුවත් ගිවිසුම් අත්සන් කර බදු අයිතිය අදාල පුද්ගලයින්ට පවරා දී නොතිබුණි.

v. තංගල්ල බස් නැවතුම් පොළ වෙළඳ සංකීර්ණයෙහි පිහිටි කඩකාමර 24 ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් 2008 වර්ෂයේදී නගර සභාව වෙත පවරා තිබූ නමුත් එම කඩකාමර තක්සේරු කර කඩකාමර කුලී මුදල් තීරණය කර අයකිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණු අතර 2011 සැප්තැම්බර් මස වන විට එකතුව රු. 179,336 ක පැරණි හිඟ මුදලක් අයවිය යුතුව තිබුණි.

**2.2.4 තානායම් බදුකුලී**

**-------------------**

නගර සභාවට අයත් තානායම නාගරික සංවර්ධන අධිකාරිය බදුගෙන තිබූ අතර 2013 දෙසැම්බර් 31 දිනට අයවියයුතු මුළු මුදල රු. 3,131,012 ක් විය. බදුකරු සමග සභාව ගිවිසුමකට එළඹ නොතිබුණි. වාර්ෂිකව නගර සභාවට අයවිය යුතු බදු මුදල් වල එකතුව වර්ෂයෙන් වර්ෂයට වැඩි වී තිබුණද එම බදු මුදල් අයකර ගැනීම සඳහා නගර සභා ආඥා පනතේ 170 අ(1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.සභාපතිවරයා විසින් 2014 දෙසැම්බර් 05 දිනැති පිළිතුරු ලිපියෙන් උක්ත හිඟයෙන් රු. 471,500 ක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඒක පාර්ශවීය ලෙස බදු ප්‍රතිශතය අඩුකිරීම මත සිදුවූ වැඩියෙන් බිල් කිරීම් බව වෙත දන්වා එවා තිබුණි.

**2.2.5 ඉඩම් බදු**

**----------**

බදුකරුවෙකුට රු. 300 ක මුදලකට නගර සභාව අසල බිම් කැබැල්ල 1983 අගෝස්තු 18 දින ගිවිසුම්ගතව බදුදී තිබූ අතර සභාව විසින් පවත්වා තිබූ ලිපිගොනු අනුව එම ස්ථානයේ නව ඉදිකිරීම් සිදුකර පදිංචිව සිටින බව තහවුරු විය. මේ හේතුවෙන් ගිවිසුම් යාවත්කාලින කර ඉඩම් බදුදීම් විධිමත්ව සිදු නොකිරීම මත සභාවේ ඉඩම් හා දේපල අයථා පරිහරණ වලට ලක්වන බවත් , ඉඩම් පවරා ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කිරීමට නොහැකි වී ඇති බවත් නිරීක්ෂණය විය.

**2.2.6 බලපත්‍ර ගාස්තු**

**----------------**

නගර සභා ආඥා පනතේ 162 (I) වගන්තිය ප්‍රකාරව බලපත්‍ර ගාස්තු පනවා අයකර නොගැනීම නිසා 2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 23,000 ක් වූ හිඟ බලපත්‍ර ගාස්තු මුදලක් පැවතුණි.
සභාපතිවරයා විසින් 2014 දෙසැම්බර් 05 දිනැති පිළිතුරු ලිපියෙන් උක්ත හිඟයෙන් රු. 14,000ක් අයකරගෙන ඇති බව මා වෙත දන්වා තිබුණි.

**2.2.7 වෙනත් ආදායම්**

**-----------------**

සභාව විසින් ගිනි නිවන රථයේ සේවා සැපයීම වෙනුවෙන් කිලෝ මීටරයකට රු. 100 ක් හා සේවා ගාස්තු ලෙස රු. 10,000 ක් ලෙස ගාස්තු අයකර තිබූ අතර මේ සම්බන්ධ විගණන පරීක්ෂාවේදී ගිණි ආපදා රථ සැපයීම වෙනුවෙන් අයවිය යුතු රු. 179,100 ක් වූ හිඟ මුදල් 2014 පෙබරවාරි 20 දින වන විටත් අයකරගෙනනොතිබුණි. 2011 හා 2012 වර්ෂයන්ට අදාල හිඟයන්ද එම හිඟ මුදල් තුළ පැවතුණි.

**2.2.8 නඩු පවරා ඇති ආදායම්**

**-------------------------**

සභාව විසින් හිඟ ආදායම් අයකර ගැනීම වෙනුවෙන් පවරන ලද නඩු වෙනුවෙන් අයවීමට ඇති මුදල් ලෙස සමාලෝචිත වර්ෂයේ ශේෂ පත්‍රයේ රු. 3,797,932 ක මුදලක් දක්වා තිබුණි.

**2.2.9 තංගල්ල මූලික රෝහලේ රෝහල් පවිත්‍රතා සේවයට අදාල ආදායම්**

**----------------------------------------------------------------------**

2013 දෙසැම්බර් 31 දිනට රෝහල් පවිත්‍රතා සේවා සැපයීම වෙනුවෙන් රු. 3,463,120 ක මුදලක් ලැබිය යුතුව තිබුණි.

**2.2.10 මුද්දර ගාස්තු**

**--------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු ප්‍රමාණය රු. 6,674,101 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**----------------------------------**

**(අ) සේවක ණය**

**--------------**

2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය රු. 183,626 ක් විය. සේවය හැර ගිය හා මියගිය සේවකයින්ගේ ණය ශේෂයන් ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට ක්‍රියාකළ හැකි වුවත් එසේ කිරීමට කටයුතු කර නොතිබූ අතර දැනට සේවයේ සිටින සේවකයින් දෙදෙනොගෙන් සහ ගුරු සේවයට මාරුවී ගිය නිලධාරිනියගෙන් අයවිය යුතු එකතුව රු. 85,363 ක මුදල විගණිත දිනය වූ 2014 පෙබරවාරි 20 දිනවන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) අනුකූලතා සහතික නිකුත් නොකිරීම**

**---------------------------------------**

1986 මාර්තු 10 දිනැති අංක 392/9 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයක් පලකරනු ලැබූ 1986 නාගරික සංවර්ධන අධිකාරිය (සැලසුම් හා ගොඩනැගිලි) නියෝග අංක 07 හි සඳහන් පරිදි සභාව විසින් ඉදිකිරීම් කටයුතු අනුමත කළ ගොඩනැගිලි සැලසුම් වෙනුවෙන් ඉදිකිරීමේ කටයුතු නිම කිරීමෙන් පසුව අධීක්ෂණ කටයුතු සිදුකර අනුකූලතා සහතික නිකුත් කිරීමට හෝ කාලය දීර්ඝ කිරීමට කටයුතු කළයුතු වුවත් 2011 වර්ෂයේඅනුමත කළ සැලසුම් 37 කට, 2012 වර්ෂයේඅනුමත කළ සැලසුම් 36 කට හා 2013 වර්ෂයේඅනුමත කළ සැලසුම් 13 කට අදාළව එලෙස කටයුතු කර නොතිබුණි.

(ඇ) **වැටුප් පරිමාණ අනුව වැටුප් නොගෙවීම**

**-------------------------------------------**

රියදුරු, මුරකරු හා පුස්තකාල සහායක තනතුරු වලට අදාළව සේවකයන් නවදෙනකුට 2006 අප්‍රේල් 25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 අනුව දෛනික වැටුප මත වැටුප් නොගෙවීම මත රු. 53,069 ක් අඩු හා වැඩි වශයෙන් වසර තුළ වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**------------------------------**

**3.2.1 අත්තිකාරම්**

**-------------------**

2011 වසරේ සිට 2013 වසර දක්වා දෙන ලද රු. 653,838 ක අත්තිකාරම් පියවීමට 2014 අගෝස්තු 08 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.2.2 අවිධිමත් ගනුදෙනු**

**--------------------**

නගර සභා ආඥා පනතේ 159 (ඊඊ) ප්‍රකාරව සභිකයින්ගේ නිවාස ස්ථාන වලට නිල දුරකථන පහසුකම් සවිකිරීම හා නඩත්තු කිරීම පිණිස සභාව විසින් දරනු ලබන සියළු වියදම් දැරීමට හැකි බව දන්වා ඇතත් පනතේ වගන්ති වලට පටහැනිව 2011 මැයි 30 දිනැති 5.3 සභා තීරණය පරිදි සභාපතිවරයාගේ නිවසේ PEO TVසම්බන්ධතාවය හා සම්බන්ධ පිරිවැය වූ රු. 15,653 ක් සභා අරමුදලින් ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

**3.2.3 විදේශ සංචාර සඳහා ගෙවීම් කිරීම**

**-------------------------------------**

ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ ජාතික සම්බන්ධීකාරකතුමියගේ 2013 මැයි 28 දිනැති ලිපිය අනුව සාමය සඳහා වූ නගරාධිපතිවරුන්ගේ 8 වන මහා සමුළුව 2013 අගෝස්තු 03 වනදා සිට අගෝස්තු 06 දක්වා ජපානයේ පවත්වා තිබූ අතර ඒ සඳහා සභාපතිතුමා සහභාගී වී තිබුණි. මෙම සමුළුවට සහභාගි වීම වෙනුවෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යංශ ලේකම්ගේ 2010 ඔක්තෝබර් 01 දිනැති අංක මු.ක්‍රි.අ. 1/2010/1 චක්‍රලේඛය අනුව සංයුක්ත, යැපුම් හා අනියම් දීමනා ලෙස ගෙවිය හැකි මුදල රු. 352,566 ක් වුවද, රු. 401,302 ක් ගෙවා තිබුණෙන් රු. 48,736 ක් වැඩිපුර ගෙවා තිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

-------------------------------

**3.3.1 නිෂ්ක්‍රීය වත්කම්**

**------------------**

අංක SPRS 1405 JCB 3CX sitemaster වර්ගයේ බැකෝ ලෝඩර් යන්ත්‍රය 2009 වර්ෂයේ සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය**

**--------------------------**

පශ්චාත් සුනාමි වෙරළ පුනරුත්ථාපන සහ සම්පත් කළමනාකරණ වැඩසටහන සහ පශ්චාත් සුනාමි ජීවනෝපාය සහාය සහයෝගීතා වැඩසටහන (IFAD ව්‍යාපෘතිය) යටතේ තංගල්ල නගර සභා බල ප්‍රදේශයේ ධීවර විවේකාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රුපියල් ලක්ෂ 178 ක් වැය කර තිබුණි.

i. මෙම ඉදිකිරීම් වැඩ නිම වී තිබුණ ද 2014 පෙබරවාරි 20 දින වන විටත් එය ජනතා අයිතියට පත් කර නොතිබුණි.
ii. සභාපතිවරයා විසින් 2013 නොවැම්බර් 28 දින එවන ලද පිළිතුරු ලිපියේ 2013 දෙසැම්බර් මාසයේදී මෙම විවේකාගාරය ජනතා අයිතියට පත්කරන බව සභපතිවරයා මා වෙත දන්වා තිබුණද , ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**3.5 පාරිසරික ගැටළු**

**------------------**

සභාවට අයත් ආදාහනාගාරය භාවිතා කිරීමට නොහැකි බවත් , පෝරනුවේ දුම කාන්දු වීමක් වන බවත් , අසල්වාසී නිවෙස්වල අයටද අපහසුතාවයන් ඇතිවන බවත් දක්වමින් ආදාහනාගාරය භාරකරු 2013 පෙබරවාරි 07 දින ලිපියකින් සභාවට දැනුම්දී තිබුණි. සභාවේ තාක්ෂණික නිලධාරියාද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාද , මෙහි ආදාහනාගාර කටයුතු සිදුකිරීම නුසුදුසු බව දක්වා තිබුණි. උක්ත ලෙස අවදානම් සහිත බව දක්වා තිබියදී ආදාහනාගාරයේ පෙබරවාරි සිට ඔක්තෝබර් මාසය දක්වා ආදාහනය කිරීම් 15 ක් සිදුකර තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

2013 වර්ෂයේ අයවැයගත ප්‍රතිපාදන හා තථ්‍ය වියදම අතර ඉහළ විචලතා ප්‍රතිශතයක් නිරීක්ෂණය වූ අතර ඒ අනුව අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදා ගෙන ඇති බව නිරීක්ෂණය නොවුනි.

**5. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වාහන පාලනයෙ
(ඈ) සේවක කළමනාකරණය